# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2447/19 – 2025 ජූලි මස 29 වැනි අඟහරුවාදා – 2025.07.29**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2025 අංක 77 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/18/2021/WS/96.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: බි/ඉ/03/ජලසම්පාදන/ අත්පත්.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2025 ජූලි මස 24 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැඳුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.–** ප්‍රාදේශීය ලේකම්, බිබිල.

2. **ඉඩමේ විස්තරය.–** ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැගම්පත්තු කෝරළේ සුළු කොට්ඨාසයේ අංක 102 බී මල්ලැහැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මාලිප්පොත (අ.ග.පි. 21) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MO/BBL/2021/373 හා 2021.11.25 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැලිවලට මායිම් :

**01. කැබලි අක්ෂර 'A' - වැද්දගෙවත්ත - ප්‍රමාණය: හෙක්. 0.6650**

උතුරට: ඩබ්ලිව්. ඩබ්ලිව්. සෙනෙවිරත්න හිමිකම් කියන වැද්දගෙවත්ත ඉඩම; නැගෙනහිරට: ඩබ්ලිව්. ඩබ්ලිව්. සෙනෙවිරත්න හිමිකම් කියන වැද්දගෙවත්ත ඉඩම සහ කැබලි අක්ෂර B; දකුණට: ඩබ්ලිව්. ඩබ්ලිව්. සෙනෙවිරත්න හිමිකම් කියන වැද්දගෙවත්ත ඉඩම, කැබලි අක්ෂර B සහ මාලිප්පොත වැව් රක්ෂිතය; බටහිරට: මාලිප්පොත වැව් රක්ෂිතය සහ ඩී. එම්. ඥාණවතී හිමිකම් කියන වැද්දගෙවත්ත ඉඩම.

**02. කැබලි අක්ෂර 'B' - වැද්දගෙවත්ත - ප්‍රමාණය: හෙක්. 0.1443**

උතුරට: ඩබ්ලිව්. ඩබ්ලිව්. සෙනෙවිරත්න හිමිකම් කියන වැද්දගෙවත්ත ඉඩම; නැගෙනහිරට: මාර්ගය, එච්. එම්. පදුම කුමාරිහාමි, එම්. එම්. ප්‍රියන්තා කුමාරි යන අය හිමිකම් කියන


1A – G 044979 – 14 (2025/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වැද්දගෙවත්ත ඉඩම සහ මාලිප්පොත වැව් රක්ෂිතය; දකුණට: එච්. එම්. පදුම කුමාරිහාමි, එම්. එම්. ප්‍රියන්තා කුමාරි යන අය හිමිකම් කියන වැද්දගෙවත්ත ඉඩම සහ මාලිප්පොත වැව් රක්ෂිතය; බටහිරට: කැබලි අක්ෂර A සහ ඩබ්ලිව්. ඩබ්ලිව්. සෙනෙවිරත්න හිමිකම් කියන වැද්දගෙවත්ත ඉඩම.

EOG 07 – 0345

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2025 අංක 21 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/2/2014/HA/218.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ඇ.ප්‍රා. ලේ./5/5/14/2012/2-ii.

අංක 2429/15 හා 2025.03.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 2A පිටුවේ පළ කරන ලද 2025 අංක 21 දරන ආඥාවේ කැබලි අංක 44, 45, 46 සහ 47 යන කැබලි අංකයන්හී ඉඩමේ නම "පොතුගුල්කන්ද වත්ත හෙවත් පොතුගුල්කන්දෙ මූකලාන" යන්න "පොත්ගුල්කන්ද වත්ත *හෙවත්* පොත්ගුල්කන්දෙ මූකලාන" ලෙස නිවැරදි විය යුතු බව මින් ප්‍රකාශ කරමි.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය.

2025 ජූලි මස 24 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 07 – 0346

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.